සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## දේශපාලන විද්‍යාව - I

13 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

උපදෙස් :-
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය වරහන් තුළ වූ තිත් ඉර ලකුණු කරන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 ක් හිමි වේ.

---

- අංක 01 සිට 20 තෙක් වූ ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ හතරක් පමණක් අතුරෙන් නිවැරදි ප්‍රකාශය පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(01) දේශපාලන විද්‍යාව,

A සමාජ විද්‍යාවක් ලෙස සැලකේ.

B මිනිසුන්ගේ දේශපාලන චර්යාවන් සහ දේශපාලන ක්‍රියාවන් අධ්‍යයනය කිරීම.

C ස්වභාවික විද්‍යාව වශයෙන් සැලකේ.

D මූලික විද්‍යාව වශයෙන් සැලකේ.

E විධිමත් ලෙස අධ්‍යයනය කිරීම ඇරඹුනේ පැරණි ග්‍රීසිය තුළය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(02) දේශපාලනය,

A බල දේශපාලනයේ ප්‍රායෝගික පැත්ත වේ.

B බලය අල්ලා ගැනීම, රඳවා ගැනීම, ව්‍යාප්ත කිරීම අරමුණු කොටගෙන ක්‍රියාත්මක වේ.

C ක්‍රීඩාවක් වන අතර ප්‍රධාන ක්‍රීඩකයින් වන්නේ දේශපාලන පක්ෂ සහ දේශපාලනඥයින්ය.

D ගැටුම්කාරී ආශාවන්ගේ අදහස්වල හා විශ්වාසයන්ගේ අවසාන ප්‍රතිඵලය වේ.

E සදාචාරාත්මක හා ආගමික අගය කිරීම්වලින් දැඩි ලෙස පාලනය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(03) දේශපාලන විද්‍යාව උපකල්පනය කරන ආකාරයට,

A මිනිසා ස්වභාවයෙන්ම දේශපාලන ජීවියෙකු වන්නේය.

B සෑම මිනිසෙක්ම උපතින්ම යම් ප්‍රමාණයක දේශපාලන ඥානයක් රැගෙන එන්නේය.

C මිනිසුන් දේශපාලනය කථා කිරීම සහ එහි නියැලීම ස්වභාවික දෙයක් වන්නේය.

D මිනිසුන්ට දේශපාලනය කෙතරම් ස්වභාවිකද යත් මිනිසුන් දේශපාලනයෙහි වෙන් කළ නොහැකි වන්නේය.

E දේපාලනය සහ දේශපාලන විද්‍යාව සම වන්නේය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(04) රාජ්‍යය,

A මිනිසුන් විසින් පිහිටුවා ඇති විවිධ සමාජ සංවිධාන අතුරෙන් එකක් පමණි.
B දුරාවබෝධ දෙයකි.
C ස්පර්ශ කළ නොහැකි අදෘශ්‍යමාන දෙයකි.
D ස්ථාවර දෙයකි.
E සම්පූර්ණ දෙයකි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(05) රාජ්‍යයේ ආරම්භය,

A දේවවරම්වාදයට අනුව දෙවියන්ගේ නිර්මාණයක් වේ.
B සමාජ සම්මුතිවාදයට අනුව සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් වේ.
C ලිබරල්වාදයට අනුව පොදු යහපත උදෙසා මිනිසුන් කළ නිර්මාණයක් වේ.
D මාක්ස්වාදයට අනුව පෞද්ගලික දේපළ ක්‍රමය පැන නැගීමේ ප්‍රතිඵලයක් වේ.
E පැසිස්ට්වාදයට අනුව දිගු සමාජ විකාශනයක ප්‍රතිඵලයකි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(06) චර්යාවාදය,

A දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් 1940 ගණන් වලදී ඇමරිකාව තුළ ආරම්භ වූ අධ්‍යයන ක්‍රමයකි.
B දේශපාලන රඟුම්කරුවන්ගේ නිරීක්ෂණය කළ හැකි චර්යාව පමණක් අධ්‍යයනය කළ යුතු බව අවධාරණය කරනු ලැබීය.
C මිනිසුන්ගේ සර්ව දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම වර්ධනය කරනු ලැබීය.
D න්‍යාය ගොඩනැගීමට සහ අධ්‍යයන විධි ක්‍රම වර්ධනය කිරීමට බෙහෙවින් දායක විය.
E ශිල්පීය උපක්‍රමවලට වඩා ප්‍රතිඵල පිළිබඳ වඩාත් සැලකිලිමත් විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(07) ආණ්ඩුව,

A සමාජයේ පොදු කැමැත්ත නියෝජනය කරන ඒජන්තවරයා ලෙස සැලකේ.
B ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ආයතන තුනෙන් සමන්විත වේ.
C ස්පර්ශ කළ හැකි අදෘශ්‍යමාන දෙයකි.
D රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ තනි උරුමක්කාරයා වේ.
E ස්ථාවර දෙයක් නොවන අතර කාලීන වෙනස් කිරීම්වලට යටත් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(08) ආණ්ඩුව පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන කිහිපයක් වන්නේ,

A මිනිස් සමාජය පාලනය කරන හා පරිපාලනය කරන සංවිධානය වේ.
B මිනිස් සමාජය පාලනය කරන සංවිධානය වේ.
C මිනිස් සමාජය කළමනාකරණය කරන සංවිධානය වේ.
D රාජ්‍ය පාලනය සඳහා සහභාගී වන පුද්ගල කණ්ඩායම අන්තර්ගත සංවිධානය වේ.
E රාජ්‍යයේ දේශසීමාව තුළ ජීවත්වන සියලුම දෙනා නියෝජනය කරන සංවිධානය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(09) ආණ්ඩුව බලය ක්‍රියාවට නංවන මාර්ග වන්නේ,

A ආණ්ඩුවේ බලය නීත්‍යානුකූල වේ යන අදහස විශ්වාස කිරීමට ජනතාව පොළඹවා ගැනීම මඟින්.

B තර්ජනය කිරීම මඟින්.

C බලය යෙදවීම මඟින්.

D ආගමික හා සදාචාර විශ්වාස මඟින්.

E දඬුවම් කිරීම මඟින්.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(10) ආණ්ඩුවේ බලය පාලනය කළ හැකි මාර්ග වන්නේ,

A පොලීසිය සහ සිවිල් සේවය.

B ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

C බලතල බෙදීම.

D සංවරණය හා තුලනය

E අධිකරණ විවරණ බලය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(11) ස්වාධිපතිත්වය,

A රාජ්‍යයෙන් පමණක් භුක්ති විඳින උසස්ම හා උත්තරීතර බලය වේ.

B අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෙයාකාර බව විග්‍රහ කර ඇත.

C රජ්‍යයේ වැදගත්ම හා විශේෂිතම අංග ලක්ෂණ වේ.

D රාජ්‍යයේ ආත්මය වන අතර බලාධිකාරී බලය යෙදවීමට රජයට සුජාතභාවය සැපයෙන සාධකය වේ.

E ප්‍රබල රාජ්‍යයන් දුබල රාජ්‍යයන්ගෙන් වෙන්කර ඇත.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(12) මහජනතාව ආණ්ඩුව සමඟ යා කරන මාර්ග වන්නේ,

A මැතිවරණ

B ජනමත විචාරණය

C දේශපාලන පක්ෂ

D රාජ්‍ය නොවන සංවිධාන

E බලපෑම් කණ්ඩායම් හා මහජන මතය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(13) ව්‍යවස්ථාදායකය,

A ඒකමණ්ඩල හා ද්වීමණ්ඩල වශයෙන් ද්වී ප්‍රභේද වේ.

B ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන අතුරෙන් විශාලතම ආයතනය වේ.

C දේශපාලන ක්‍රමයක සුජාතභාවය සහිත නීති නිර්මාණය කරන ලෙස පිළිගනී.

D රාජ්‍ය මුල්‍ය පිළිබඳ භාරකරුවා වේ.

E ආණ්ඩුවේ විධායක හා අධිකරණ අංශවලට වඩා පහත් ආයතනයක් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

The National e-learning Portal for the General Education

(14) විධායකය,

A රාජ්‍ය සැලසුම් හා නීති ක්‍රියාවට නැංවීමේ වගකීම හිමි ආණ්ඩු ආයතනය වේ.

B දේශපාලන සහ ස්ථිර යනුවෙන් කොටස් දෙකකින් යුක්තය.

C කාර්යයන් ක්‍රියාවට නංවන්නේ පොලීසිය හා රාජ්‍ය සේවය හරහා ය.

D තම හෘද සාක්ෂියට හැරුණු විට වෙනත් කිසිවෙකුට වගකීමට බැඳී නොමැත.

E ඒකාධිපති, ජනාධිපති හා පාර්ලිමේන්තුව වශයෙන් ත්‍රිවිධාකාර වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(15) අධිකරණය,

A නීති පිළිබඳව තීරණ ගැනීමේ නිල බලය පැවරුණු ආණ්ඩුවේ තුන්වන අංශය වේ.

B ස්වාධීන, අපක්ෂපාතී හා නිර්භය විය යුතු යැයි අපේක්ෂා කෙරේ.

C විධායකයේ ආශාවන් අනුව ක්‍රියා කළ යුතු යැයි අපේක්ෂා කෙරේ.

D යුක්තිය හා සාධාරණත්වයේ උත්තරීතර අපේක්ෂකයා ලෙස සැළකේ.

E අග විනිසුරු කෙනෙකුගේ නායකත්වය යටතේ පහළ සිට ඉහළට උසාවි පද්ධතියක් මත සංවිධානය කර ඇත.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(16) කැබිනට් ආණ්ඩු ක්‍රමය ජනාධිපති ආණ්ඩු ක්‍රමයෙන් වෙනස් වන සාධක වන්නේ,

A විධායකය තේරී පත්වන ආකාරය.

B විධායක ව්‍යවස්ථාදායක සම්බන්ධතා.

C ආණ්ඩුවේ ව්‍යුහයන් හා කාර්යයන්.

D ප්‍රජාතන්ත්‍රිකභාවයේ ප්‍රමාණය.

E ස්ථාවරභාවය හා කාර්යක්ෂමතාවය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(17) විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව ආණ්ඩු වර්ග කරනු ලබන්නේ,

A කැබිනට් හෙවත් පාර්ලිමේන්තු

B සමාජ ප්‍රජාතන්ත්‍රවාදී

C ජනාධිපති

D මිශ්‍ර විධායක

E ඒකතන්ත්‍ර

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(18) කැබිනට් ආණ්ඩු ක්‍රමය,

A බහුවිධ සමාජ ක්‍රමයක්ම වඩාත් සුදුසු වේ.

B නාමික හා සත්‍ය යනුවෙන් විධායක දෙකකින් යුක්ත වේ.

C දේශපාලන පක්ෂ පදනම් කරගත් ආණ්ඩු ක්‍රමයක් ලෙසද සැළකේ.

D වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී සහ වඩාත් වගකීම් සහිත නමුත් කාර්යක්ෂමතාවයෙන් අඩු ලෙස සැළකේ.

E පක්ෂ මත පදනම්ව ක්‍රියාත්මක වීම නිසා දේශපාලන වශයෙන් අස්ථාවර වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(19) ජනාධිපති ආණ්ඩු ක්‍රමය,

A ජනාධිපති නමින් හඳුන්වන තනි විධායකයකින් යුක්තය.

B ප්‍රජාතන්ත්‍රභාවයෙන් අඩු වුවද වඩාත් කාර්යක්ෂම වේ.

C ශක්තිමත් විධායකය හේතුකොට ගෙන දේශපාලන ස්ථාවර භාවය වැඩිය.

D බහු පක්ෂ ක්‍රම සහිත රටවල් වලට වඩාත් සුදුසු වේ.

E ඒකාධිපති ආණ්ඩු ක්‍රමයක් ලෙස සැලකේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(20) සන්ධීය ආණ්ඩු ක්‍රමය,

A විවිධ මට්ටම් සහිත ආණ්ඩු අතර සිරස් ආකාරයට බලය හුවමාරු කර ගැනීමේ පදනම මත ගොඩනැගී ඇත.

B බලතල බෙදීමේ තවත් ක්‍රමයක් ලෙස සලකනු ලැබේ.

C විවිධ වාර්ගික ජන කොටස් එක් දේශපාලන ක්‍රමයක් අනුගත කරවීම සඳහා ප්‍රයෝජනවත් වේ.

D විවිධත්වය සමඟ ඒකීයත්වය බද්ධ කරන ක්‍රමයක් ලෙස විග්‍රහ කර ඇත.

E සජාතීය සමාජ ක්‍රම පවතින රටවල් සඳහා වඩාත් යෝග්‍ය බව පිළිගනු ලැබේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

- **අංක 21 සිට 26 දක්වා වූ ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ පහ අතුරෙන් එක් ප්‍රකාශයක් වැරදිය. වැරදි ප්‍රකාශය තෝරන්න.**

(21) දේශපාලන පක්ෂ,

(1) බල අරගලයේ ප්‍රධාන රඟුම්කරුවන් වේ.

(2) සමාජ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ වැදගත් නියෝජිතයින් වේ.

(3) ජනතා හා කේවල ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

(4) ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරීත්වය සඳහා අනවශ්‍ය වේ.

(5) දේශපාලන සමාජානුයෝජන ක්‍රියාදාමයේ වැදගත් නියෝජිතයින් වේ. (......)

(22) නිදහස් හා සාධාරණ මැතිවරණයක මූලික ලක්ෂණය වන්නේ,

(1) කාලීනව පැවැත්වීම.

(2) තාර්කිකව තීරණ ගැනීම සඳහා ඡන්දදායකයාට පූර්ණ නිදහස තිබීම.

(3) සුදුසුකම් නොසලකමින් සැම අයෙකුටම ඡන්ද බලය ලබා දීම.

(4) සුදුසුකම් සහිත ඕනෑම අයෙකුට ඡන්දබලය ලබා දීම.

(5) සැම ඡන්දයක්ම ගණනය කිරීම හා ප්‍රතිඵල විවෘතව සහ නිවැරදිව දැකීම. (......)

(23) බලතල බෙදීම ප්‍රයෝජනවත් වන්නේ,

(1) විධායකයේ බලය සංවරණය කිරීමටයි.

(2) ව්‍යවස්ථාදායකයේ බලය සංවරණය කිරීමටයි.

(3) අධිකරණයේ බලය සංවරණය කිරීමටයි.

(4) ආණ්ඩුවේ බලය සංවරණය කිරීමටයි.

(24) මානව අයිතිවාසිකම්,

(1) මිනිසෙක් වීම නිසාම මිනිසාට හිමිවන්නා වූ අයිතිවාසිකම්ය.

(2) සෑම මිනිසෙකුටම හිමි වන බැවින් විශ්වීය ස්වරූපයක් ගනී.

(3) අහිමි කිරීමට, පවරා දීමට සහ ආපසු ගැනීමට නොහැකි බැවින් මූලික අයිතිවාසිකම් බවට පත්වේ.

(4) මානවයන්ගේ ආත්ම ගරුත්වයට සහ පැවැත්මට අවශ්‍ය වේ.

(5) නීතියෙන් හිමිකම් කිවහැකි අයිතිවාසිකම් පමණක් වේ. (......)

(25) බ්‍රිතාන්‍ය දේශපාලන ක්‍රමයේ මූලික ලක්ෂණ වනුයේ,

(1) අලිඛිත ව්‍යවස්ථාව
(2) අසහාය රාජ්‍යත්වය
(3) නීතියේ අධිපතීත්වය
(4) පාර්ලිමේන්තු ස්වාධිපතීත්වය
(5) සම්ප්‍රදායන් (......)

(26) මහා බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව,

(1) නීති සම්පාදනය සම්බන්ධයෙන් ස්වාධිපති බලය දරන අතර එම හේතුවෙන් ඕනෑම නීතියක් සෑදීමට හෝ අවලංගු කිරීමට බලය තිබේ.

(2) ද්වීමාණ්ඩලික වන අතර එයින් බලවත්ම ආයතනය මහජන මන්ත්‍රී මණ්ඩලය වේ.

(3) විශ්වසභංග යෝජනාවක් මගින් දේශපාලන විධායකය ඉවත් කිරීමේ හැකියමක් භුක්ති විඳී.

(4) දේශපාලන විධායකය තෝරාපත් කරන මූලාශ්‍රය වේ.

(5) නාමික විධායකය විසින් ස්වකීය අභිමතානුසාරී බලය යොදවා විසුරුවා හැරීමට යටත් වේ. (......)

- **අංක 27 සිට 30 දක්වා ප්‍රශ්නවලට සපයා ඇති ප්‍රකාශ 05 අතුරින් 04 ක් පමණක් නිවැරදි වේ. වැරදි ප්‍රකාශය පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.**

(27) ධනවාදී ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණ වන්නේ,

A පෞද්ගලික දේපොළ හිමිකම පිළිගැනීම.

B නිදහස් ව්‍යවසාය පිළිගැනීම.

C විවෘත වෙළඳපොළ ක්‍රමය පිළිගැනීම.

D ආර්ථිකය පාලනය කිරීම සඳහා රාජ්‍යය අවම මැදිහත්වීම.

E රාජ්‍යය කිසිවක් නොකළ යුතුය සහ පෞද්ගලික අංශය සියල්ල කළ යුතුය යන න්‍යාය පිළිගැනීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(28) සමාජවාදී ආණ්ඩුවක ප්‍රධාන ලක්ෂණය වනුයේ,

A තනි පාක්ෂික නායකත්වය පතිත දේශපාලන ක්‍රමය.

B පෞද්ගලික දේපොළ අයිතිය නොපැවතීම.

C නිෂ්පාදනය, බෙදාහැරීම හා හුවමාරුව පිළිබඳ රාජ්‍ය ඒකාධිකාරිය.

D දේශපාලන නිදහස කැප කිරීම මත ගොඩනැගුණු ආර්ථික සමානාත්මතාව.

E ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් ගොඩ නගා තිබීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(29) ඒකාධිපති ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වනුයේ,

A තමන් විසින්ම පත්කරගත් පාලකයා.
B නීතියට යටත් නොවූ අසහාය පාලකයා.
C පාලකයාට වගකීමට යමක් නොවීම.
D නිශ්චිත ආර්ථික හා දේශපාලන දර්ශනයක් මත පාලනය පවත්වාගෙන යාම.
E පාලිතයන් මත රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම සඳහා හිංසාකාරී ක්‍රියාමාර්ග භාවිතයට ගැනීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(30) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුදාමයක මූලික ලක්ෂණ වනුයේ,

A ව්‍යවස්ථානුකූල ආණ්ඩුව හා නීතියේ ආධිපතීත්වය.
B මහජන ස්වාධිපතීත්වය හා පාලකයින් ජනතාවට වගකීම.
C අධිකරණයේ ස්වාධීනත්වය.
D තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමය හා මාධ්‍ය නිදහස.
E සියලුම මිනිසුන් ඒක හා සමානයි. නමුත් සමහර මිනිසුන් අනෙක් අයට වඩා සමානය යන සිද්ධාන්තය පිළිගැනීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

- **අංක 31 සිට 40 දක්වා ඇති ප්‍රශ්න සඳහා ඇති ප්‍රකාශ පහෙන් මාතෘකාවට අදාළ කාණ්ඩය තෝරන්න.**

(31) 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මඟින්,

A සීමිත ඡන්ද බලය ප්‍රධානයට යෝජනා කරන ලදී.
B ආණ්ඩුකාරයාගේ තනි මතය අනුව පාලනය කිරීමේ බලය දුර්වල කරන ලදී.
C ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ආරම්භක පදනම දමන ලදී.
D ආණ්ඩුකාරයාට සහය වීම පිණිස විධායක සහ ව්‍යවස්ථාදායක සභා පිහිටුවන ලදී.
E ආණ්ඩුක්‍රමය එක්සේසත් කරන ලදී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(32) 1911 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මඟින්,

A ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව 21 දක්වා වැඩි කළේය.
B ප්‍රථමවරට නියෝජන මූලධර්ම හඳුන්වා දුන්නේය.
C ආණ්ඩුකරුගේ බලතල පුළුල් ලෙස කප්පාදු කළේය.
D වාර්ගික නියෝජනය එසේම පවත්වාගෙන ගියේය.
E ඡන්දයෙන් එක් නියෝජිතයකු තෝරාපත් කිරීමට ස්වදේශිකයින්ට බලය දුන්නේය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(33) 1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ මූලික ලක්ෂණ වන්නේ,

A වාර්ගික නියෝජනය සීමා කිරීම.
B ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව 49 දක්වා වැඩි කිරීම.
C ව්‍යවස්ථාදායක සභාව තුළ ප්‍රථම වරට ඡන්දයෙන් පත්වූ මන්ත්‍රීවරුන් බහුතරය බවට පත් කිරීම.
D මුදල් කාරක සභාවේ බලතල කාර්යයන් ශක්තිමත් කිරීම.
E බලය හා වගකීම වෙන් කරන ලද ආණ්ඩු ක්‍රමයක් ගොඩනැඟීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(34) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය,

A විධායක සහ ව්‍යවස්ථාදායක යන ද්විත්ව කාර්යයන්ට පැවරුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවක් පිහිටුවීම.

B සර්ව ජන ඡන්ද බලය ලබා දීම.

C විධායක කාරක සභා සභාපතිවරුන්ගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩලයක් පිහිටුවීම.

D රාජ්‍ය නිලධාරීන් හා කථානායකවරයා හැර රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනෙක් සෙසු මන්ත්‍රීවරුන් ඇතුළත් වන පරිදි විධායක කාරක සභා 07 ක් පිහිටුවීම.

E මුදල් රාජ්‍ය සේවය හා නීති කටයුතු භාරව රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු පත් කිරීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(35) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය,

A වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් ඉල්ලා සිටීම සඳහා ලංකාව පුරුදු පුහුණු කළේය.

B පරිපාලනය පිළිබඳව දේශපාලනඥයින්ට පුහුණුව ලබා දුන්නේය.

C ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමය දුර්වල කිරීම සඳහා විශාල ලෙස දායක විය.

D වගකීම් සහිත ආණ්ඩුවක් ලබා ගැනීමේ සටනට වේදිකාවක් සපයා දුන්නේය.

E නියෝජන ආණ්ඩු ක්‍රමය සහ වගකීම් ආණ්ඩු ක්‍රමය යන දෙක අතර කලින් පැවතියා වූ අප්‍රසන්න පරතරය නැති කළේය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(36) ලංකාවේ ජාතික ව්‍යාපාරය,

A ආසියාව තුළ තිබූ වඩාත්ම සාමකාමී ජාතික ව්‍යාපාරය විය.

B බටහිරකරණය වූ සමාජ ප්‍රභූන් විසින් ආරම්භ කළ සහ මෙහෙය වූ ව්‍යාපාරයක් විය.

C ප්‍රධාන වශයෙන් ඉල්ලා සිටියේ අභ්‍යන්තර ස්වයං පාලන ක්‍රමයක්ය.

D ජනතාවාදී ව්‍යාපාරයක් නොවීය.

E ඉන්දියානු ජාතික ව්‍යාපාරයට බෙහෙවින් සමාන විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(37) 1948 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය,

A බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය තුළ ලංකාවට ඩොමිනියන් තත්වයක් ප්‍රදානය කළේය.

B බ්‍රිතාන්‍ය කිරීටය ලංකාවේ රාජ්‍ය නායකයා බවට පත් කළේය.

C බ්‍රිතාන්‍ය ක්‍රමයට අනුරූප වූ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් පිහිටුවීම.

D නීති නිර්මාණය කිරීමට සීමිත බලයක් සහිත ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කළේය.

E අවසාන අභියාචනාධිකරණය බලය සහිත ශ්‍රේෂ්ඨාධිකරණයක නායකත්වයක් නිර්මාණය කළේය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(38) 1948 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යටතේ ස්ථාපිත කළ ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ,

A නාමික හා සත්‍ය වශයෙන් හැඳින්වුණු ද්විත්ව විධායකය.

B ඉහළ හා පහළ යනුවෙන් හැඳින්වුණු මණ්ඩල දෙකකින් යුත් ව්‍යවස්ථාදායකය.

C එංගලන්තයේ රාජාධිකරණයට අවසාන අභියාචනාධිකරණ බලය පැවරුණු අධිකරණ පද්ධතිය.

D සුළුජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට විශේෂයෙන් දක්වන ලද ව්‍යවස්ථා සංවරණ පද්ධතිය.

E දේශපාලනයේ විධායකය මඟින් පාලනය කළ ස්වාධීන නොවූ රාජ්‍ය සේවාව.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(39) 1948 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය,

A කැබිනට් මණ්ඩලය යන නිළ නාමයෙන් හැඳින්වින.

B ව්‍යවස්ථාදායකයේ සාමාජිකයින් අතුරින් නාමික විධායකය පත් කරනු ලැබේ.

C අගමැතිවරයා නායකත්වය දරනු ලැබීය.

D ව්‍යවස්ථාදායකයට සාමුහිකව වගකිව යුතු විය.

E ව්‍යවස්ථාදායකය තුළ සම්මත කරන ලද දෝෂාභියෝගයේ යෝජනාවකින් නිළයෙන් පහ කළ හැකි විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(40) සුළුතර කණ්ඩායම්වල ආරක්ෂාව උදෙසා සෝල්බරි ව්‍යවස්ථාවෙන් සැපයූ ව්‍යවස්ථා ආවරණ වන්නේ,

A අයිතිවාසිකම් පනත

B සෙනෙට් මණ්ඩලයට හා මහජන මන්ත්‍රී මණ්ඩලයට නාමකරණයෙන් නියෝජිතයින් හය දෙනෙකු පත් කිරීම.

C බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ.

D ස්වාධීන අධිකරණය හා රාජ්‍ය සේවය.

E 29 වන වගන්තිය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

- **අංක 41 - 42 දක්වා වූ ප්‍රශ්නවලට සපයා ඇති ප්‍රකාශ අතුරෙන් හතරක් මාතෘකාවට අදාළ නොවේ. අදාළ නොවන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

(41) ශ්‍රී ලංකාවේ බලපෑම් කණ්ඩායම්,

A ප්‍රධාන වශයෙන් සංවිධානය කර ඇත්තේ වෘත්තීය හා ආගමික කරුණු මුල් කරගෙනය.

B ආණ්ඩුවෙන් සපයන ආධාර මත ක්‍රියාත්මක වේ.

C මධ්‍යම බල අධිකාරියක් මඟින් පාලනය වේ.

D ඉතාම දුර්වල වන බැවින් බලපෑම් කළ හැකි ප්‍රමාණය සීමිතයි.

E දේශපාලනයෙන් මුලුමනින්ම තොරය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(42) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය,

A බහුපක්ෂ ක්‍රමයකි.
B ද්වී පක්ෂ ක්‍රමයකි.
C ඒක පක්ෂ නායකත්වය සහිත බහු පක්ෂ ක්‍රමයකි.
D කේඩර පක්ෂ වලින් පමණක් සමන්විත ක්‍රමයකි.
E ඒක පක්ෂ ක්‍රමයකි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

- **අංක 43 - 46 දක්වා ප්‍රශ්නවලට සපයා ඇති ප්‍රකාශ පහ අතුරෙන් එක් ප්‍රකාශයක් වැරදිය. වැරදි ප්‍රකාශය තෝරන්න.**

(43) දේශපාලන සමාජානුයෝජනයේ ඒජන්තවරුන් වන්නේ,
(1) පවුල, පාඨශාලාව සහ සමවයස් කණ්ඩායම්.
(2) කටකථා හා සුරංගනා කථා
(3) ආගමික සංවිධාන
(4) දේශපාලන පක්ෂ හා ආණ්ඩුව
(5) සමාජ ක්‍රමය හා ආර්ථික පසුබිම (......)

(44) රාජ්‍ය පරිපාලනය,
(1) ආණ්ඩුවේ ක්‍රියාකාරී අංශ වේ.
(2) ආණ්ඩුවේ අරමුණු ඉටුකර ගැනීමේ යාන්ත්‍රණය වේ.
(3) ආණ්ඩුවේ පරිපාලනය ගැන පමණක් සැලකිලිමත් වේ.
(4) පෞද්ගලික අංශයේ පරිපාලනයේ කොටසක් වේ.
(5) දේශපාලන මැදිහත්වීම් වලින් තොරව තබාගත යුතුවේ. (......)

(45) අන්තර් ජාතික දේශපාලනය,
(1) ජාතීන් අතර කෙරෙන්නා වූ දේශපාලනය ලෙසද හැඳින්වේ.
(2) නිදහස්, ස්වාධිපති, ජාතික රාජ්‍යයන් අතර කෙරෙන්නාවූ දේශපාලනය ලෙසද හැඳින්වේ.
(3) රාජ්‍ය හා එක්සත් ජාතීන්ගේ සංවිධානය අතර කෙරෙන්නාවූ දේශපාලනය ලෙසද හැඳින්වේ.
(4) ලෝක දේශපාලනය ලෙසද හැඳින්වේ.
(5) ජාතීන්ගේ බල අරගලය ලෙසද හැඳින්වේ. (......)

(46) අන්තර් ජාතික දේශපාලනයේ ප්‍රධාන රැඟුම්කරුවන් වන්නේ,
(1) පුද්ගලයින් (2) නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන්
(3) අන්තර් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන (4) බහු ජාතික සමාගම්
(5) බලපෑම් සහගත ඉතා වැදගත් පුද්ගලයින් (......)

- **අංක 47 සිට 50 දක්වා වූ ප්‍රශ්න සඳහා දක්වා ඇති ප්‍රකාශ අතුරෙන් ඒ ඒ මාතෘකාවට අදාළ ප්‍රකාශ කාණ්ඩ තෝරන්න.**

(47) 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ආණ්ඩු ක්‍රමයේ විශේෂිත ලක්ෂ කිහිපයක් වන්නේ,

A සත්‍ය විධායකයේ නායකයා විසින් නාමික විධායකය පත්කරයි.
B නාමික විධායකයේ නායකයා විසින් සත්‍ය විධායකය පත්කරයි.
C පාර්ලිමේන්තුවේ ස්වාධිපති න්‍යාය පදනම් කරගෙන පිහිට වූ එක මාණ්ඩලික ව්‍යවස්ථාදායකය.
D නීති විවරණය කිරීමේ බලය සහිත අභියාචනාධිකරණයක නායකත්වයෙන් යුත් අධිකරණ ක්‍රමය.
E දේශපාලන විධායකයේ සෘජු පාලනයට යටත් කරන රාජ්‍ය සේවය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(48) ලංකා ජාතික සංගමය,

A 1919 පිහිටුවනු ලැබීය.

B වාර්ගික හා ප්‍රාදේශීය කණ්ඩායම් කිහිපයක එකතුවක් විය.

C අභ්‍යන්තර බෙදීම් හේතුකොටගෙන ශක්තිමත් සංවිධානයක් විය.

D සමාජයේ සෑම ආර්ථික හා සමාජ කණ්ඩායමක්ම එක්තැන් වූ ජනතා ව්‍යාපාරයක් විය.

E ඉංග්‍රීසි භාෂාව උගත් ධනවත් මධ්‍යම පාන්තිකයන් නායකත්වය දැරූ ව්‍යාපාරයක් විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(49) අධිකරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය සඳහා 1832 දී කැමරන් ඉදිරිපත් කළ නිර්දේශ අතුරෙන් ප්‍රධාන ඒවා වූයේ,

A අධිකරණ පරිපාලනය සම්බන්ධයෙන් ආණ්ඩුකාරයා සතු බලය කප්පාදු නොකළ යුතු වීම.

B ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය සමස්ත දිවයිනටම බලපාන අයුරින් පුළුල් කළ යුතු වීම.

C දිස්ත්‍රික්කයට එකක් වන සේ සෑම දිස්ත්‍රික්කයකටට දිස්ත්‍රික් උසාවි පිහිටුවිය යුතු වීම.

D දිස්ත්‍රික් උසාවිවලට පූර්ණ සිවිල් අධිකරණ බලයද, සීමිත අපරාධ අධිකරණ බලයද පැවරිය යුතු වීම.

E යුරෝපීයන් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ක්‍රියාත්මක කළ වෙනම සිවිල් අධිකරණ බලය අහෝසි කළ යුතු වීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(50) ශ්‍රී ලංකාව තුළ ජාතික ව්‍යාපාරය පැනනැගීම කෙරෙහි බලපෑ හේතු,

A බටහිර අධ්‍යාපනය ලද මධ්‍යම පන්තියේ නැගී ඒම.

B ආගමික පුනර්ජීවන ව්‍යාපාරය.

C 1911 දී ආරම්භ වූ අමද්‍යප ව්‍යාපාරය.

D භාෂා ප්‍රශ්නය මත වාර්ගික කණ්ඩායම් අතර ඇතිවන බෙදීම.

E වගකිව යුතු ආණ්ඩුවක් ලබාගැනීමේ අවශ්‍යතාව.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# දේශපාලන විද්‍යාව - II

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

සැලකිය යුතුයි :-

- මෙම ප්‍රශ්ණ පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් 03 කි.
- **A** කොටසෙහි සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුයි.
- **B** හා **C** කොටස් සඳහා පිළිතුරු සැපයීමට ලියන කඩදාසි යොදාගන්න.
- පිළිතුරු සපයා අවසානයේ **A, B** හා **C** කොටස්වල පිළිතුරු අමුණා භාර දිය යුතුයි.

## A කොටස

(01) බලතල බෙදීමේ සිද්ධාන්තය ඉදිරිපත් කළ කතුවරයා හා කෘතිය සඳහන් කරන්න.

(02) ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා දෙක නම් කරන්න.

(03) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු කරුණු දෙකක් නම් කරන්න.

(04) විධායක කාරක සභා ක්‍රමය අසාර්ථක වීමට හේතු දෙකක් දක්වන්න.

(05) සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීමේ ප්‍රතිඵල දෙකක් ලියන්න.

(06) කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණයට අදාළව සිදුවීම් 02 ක් සඳහන් කරන්න.

(07) මෙරට ජාතික ව්‍යාපාරයේ ක්‍රියාමාර්ග 02 ක් සඳහන් කරන්න.

(08) 1972 මගින් හඳුන්වා දෙන ලද නවාංග 02 ක් ලියන්න.

(09) ඇමරිකානු නිදහස් ප්‍රකාශනය හා ප්‍රංශ පුරවැසි අයිතීන් පිළිබඳ ප්‍රකාශනය කවර වර්ෂයන්හිදී එළිදක්වන ලදද?

(10) මානව හිමිකම් සුරක්ෂිත කරන වෛකල්පිත ගිවිසුම් 02 ක් සඳහන් කරන්න.

(11) අයිතිවාසිකම් භුක්ති විඳීම පිළිබඳ ප්‍රභේද 02 ක් ලියන්න.

(12) සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කළ වර්ෂය හා පණත නම් කරන්න.

(13) මෙරට වාමාංශික ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු 02 ක් ලියන්න.

(14) ඩොනමෝර් යුගයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට සභිකයින් පත් කළ ක්‍රම 02 ක් සඳහන් කරන්න.

(15) සෙනෙට් සභාවේ කටයුතු 02 ක් ලියා දක්වන්න.

(16) සමාන පුරවැසියන් හා සමාන අවස්ථා යන්නෙන් කුමක් අදහස් වේද?

(17) නිදහස භුක්ති විඳීම පිළිබඳ ප්‍රභේද 02 ක් ලියන්න.

(18) ලංකාවේ පරිපාලනය විමධ්‍යගත කිරීම සඳහා හඳුන්වා දෙන ලද ඓතිහාසික ක්‍රමවේද 02 ක් ලියන්න.

(19) මානව හිමිකම් සුාරක්ෂිත කරන වෛකල්පිත ගිවිසුම් 02 ක් සඳහන් කරන්න.

(20) 1921 ද්‍රවිඩ සංගමය ජාතික සංගමයෙන් ඉවත්ව යෑමට හේතුව සඳහන් කරන්න.

## B කොටස

(01) (i) රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනස පැහැදිලි කරන්න.

(ii) ආණ්ඩුවේ කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ආණ්ඩුක්‍රම වර්ගීකරණය කෙටියෙන් පැහැදිලි කරන්න.

(02) (i) ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රම අතර ඇති වෙනස්කම් කවරේ ද?

(ii) සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් හා අයහපත් ලක්ෂණ ලැයිස්තුගත කරන්න.

(iii) සන්ධීය ක්‍රමය සහ සහසන්ධීය ක්‍රමය අතර වෙනස පැහැදිලි කරන්න.

(03) (i) නියෝජනය යන සංකල්පය හඳුන්වන්න.

(ii) සරල බහුතර නියෝජන ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය අර්ථ දක්වන්න.

(iii) එම නියෝජන ක්‍රම දෙකේ මූලික වෙනස්කම් ලැයිස්තුගත කරන්න.

(04) (i) අයිතිවාසිකම් වර්ගීකරණය පැහැදිලි කරන්න.

(ii) මූලික හා මානව අයිතිවාසිකම් අතර වෙනස පැහැදිලි කරන්න.

(iii) අයිතිවාසිකම් ආරක්‍ෂා කරන විධිවිධාන විස්තර කරන්න.

The National e-learning Portal for The General Education

## C කොටස

(05) ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ පහත දැක්වෙන ආයතවල ක්‍රියාකාරීත්වය විස්තර කරන්න.

(i) රාජ්‍ය මන්ත්‍රණ මණ්ඩලය

(ii) රාජ්‍ය නිලධාරීන් අත වැදගත් වන පාලන කටයුතු රැඳවීම.

(06) සෝල්බරි ව්‍යවස්ථාව සුළු ජාතිකයින්ගේ ආරක්‍ෂාව සඳහා යෙදූ විධිවිධාන හා ඒවායේ කාර්යක්‍ෂමතාවය පැහැදිලි කරන්න.

(07) නිදහසට පෙර යුගයේ ලංකාවේ වාමාංශික ව්‍යාපාරය පහත ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.

(i) ව්‍යාපාරයට පසුබිම

(ii) සාමාජිකත්වය හා නායකත්වය

(iii) අරමුණු හා ක්‍රියාමාර්ග

(08) (i) ජාතික ව්‍යාපාරයේ අරමුණු,

(ii) අරමුණු දිනාගැනීමට දියත් කළ ක්‍රියාමාර්ග විස්තර කරන්න.